රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 09/2025(I)

මගේ අංකය : EST-1/CIRL/03/0001-(I)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2026.05.15

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>රාජ්‍ය ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2025.04.02 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2025 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ 2.1.2 වැනි උප වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

2.1.2 (අ) සියලුම රාජ්‍ය ආයතනයන්හි තනි භාවිත ප්ලාස්ටික් වතුර බෝතල් මිලදී ගැනීම හා භාවිතය 2026.05.31 දින සිට සම්පූර්ණයෙන් නතර කළ යුතු වේ.

(ආ) පහත සඳහන් ගැසට් පත්‍ර මඟින් භාවිතය තහනම් කර ඇති තනි භාවිත ප්ලාස්ටික් ඔබ ආයතන තුළ භාවිතයෙන් වැළැක්වීම සඳහා සියලුම ආයතන ප්‍රධානීන් අවශ්‍ය කටයුතු කළ යුතු වේ.

i. අංක 2341/30 දරන 2023.07.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය

ii. අංක 2034/37 දරන 2017.09.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය

03. තවද, 2025.04.02 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2025 හි සඳහන් අනෙකුත් විධිවිධාන තවදුරටත් බලාත්මක වේ.

04. මෙම චක්‍රලේඛය පරිසර අමාත්‍යාංශයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112692158
විද්‍යුත් ලිපිනය : ad-1-est@pubad.gov.lk